# අනුෂ පැල්පිට මහතාගේ පත්වීම පිළිබඳව වූ ප්‍රකාශය

**2016 මැයි 27 වන දා, කොළඹ, ශ්‍රී ලංකාව:** විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනුෂ පැල්පිට මහතා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස පත්කොට ඇති බව පුවත් පත් වාර්තා වලින් දැක්වේ. පුළුල් ලෙස පළවූ පුවත් වාර්තා වලින් දැක්වෙන පරිදි මහජන දේපල වලට එරෙහි වැරදි පිළිබඳ පනත සහ විදුලි සංදේශන නියාමන කොමිෂන් සභා (S.L.T.R.C) පනත ට අනුව පැල්පිට මහතාට එරෙහිව කොළඹ මහාධිකරණයෙහි නඩු පවරා ඇත. 2014 ඔක්තෝම්බර් මස 30 වන දින සිට 2015 ජනවාරි 05 වන දා අතර කාලය තුළ ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවට අයත් රුපියල් මිලියන 600 ක අරමුදල් අයුතු ලෙස අයත් කර ගැනීමේ චෝදනාව මත ඔහුට අධිචෝදනා ගොනු කර, නඩු විභාගයට මුහුණ දීමට නියමිතව ඇත.

අනිකුත් සියලු චූදිතයන් හට මෙන්ම පැල්පිට මහතාට ද වරදක් ඔප්පු කරනු ලබන තෙක් නිර්දෝෂීභාවය පිළිබඳ පූර්ව නිගමනයෙහි රැකවරණයට අයිතියක් ඇත. නමුත් ඔහු රජයේ වැදගත් තනතුරකට පත් කරනු ලැබීම එමගින් සාධාරණීකරණය කළ නොහැකිය. ඔහු පිළිබඳ ව හුදෙක් පරීක්ෂණ පැවැත්වෙනවා පමණක් නොවේ. ඉහත සඳහන් වූ පරිදි නීතිපතිවරයා විසින් ඔහුට එරෙහිව මහාධිකරණයේ නඩු පවරා ඇත.

උසාවියක් හෝ ව්‍යවස්ථාපිත අධිකාරියක් විසින් රාජ්‍ය නිලධාරියෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින විට අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය ආයතන සංග්‍රහයේ XLVII වන පරිච්ඡේදයේ 27 වන ජේදයේ දක්වා ඇත. සිවිල් සමාජ සංවිධාන ගණනාවක් විසින් දැනටමත් පෙන්වා දී ඇති පරිදි, රාජ්‍ය නිලධාරියෙකුට එරෙහිව සාපරාධී වරදක් හෝ අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ වී ඇති විටක ආදාළ නිලධාරියා අයත් වන අධිකාරිය විසින් වහාම ඔහු වැඩතහනම් කිරීමකට ලක් කළ යුතු බව 27:10 වන ජේදයෙන් නියම කොට තිබේ. මෙහිදී අවධාරණාත්මක ලෙස කිවයුතු කරුණක් වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ නීන්දු ගණනාවකින්ම ප්‍රකාශ කරනු ලැබ ඇති පරිදි, මෙවැනි තත්ත්වයක් පිළිබඳව පොදුවේ ආයතන සංග්‍රහයේ සහ විශේෂයෙන්ම එහි (XLVII පරිච්ඡේදයේ) 27:10 ජේදයේ නියම කොට ඇති ක්‍රියාපටිපාටීන් නියෝගාත්මක (Mandatory) වන බව සහ නිසි නෛතික අධිකාරිමය බලයකින් තොරව ඒවා ඉක්මවා ක්‍රියාකිරීම හෝ නොතකා හැරීම කළ නොහැකි වන බවය.

මෙම තීරණය යහ පාලනයේ සහ නීතියේ ආධිපත්‍යයේ මූලික ශික්ෂාවන් හට එරෙහිව යන්නක් වේ. පසුගිය දූෂණයන් පිළිබඳ පරීක්ෂණ ඉදිරියට ගෙන යාමට රජයට බරපතල උවමනාවක් නොමැති බව හා මහා පරිමාණ දූෂණයන් පිළිබඳ ව චෝදනා ලැබූවන් රාජ්‍ය අධිකාරීන් හී බලතල දැරීම රජයට ගැටළුවක් නොවනවා වැනි හැඟීමක් එමගින් ජනනය වේ.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහ යහපාලනය සඳහා වූ එක්සත් ජාතික පෙරමුණේ මැතිවරණ ව්‍යාපාරයන්හී ප්‍රධානතම හා වැදගත්ම කරුණක් වූයේ යහපාලනයයි. එබැවින් තම ක්‍රියාකාරීත්වයේ සියලු පැතිමානයන් වෙතින් යහපාලන ගුණාංගයන් විදහා දැක්වෙන බවට වගබලා ගැනීම රජයට පැවරෙන වගකීමක් වේ. එසේ කිරීමට අසමත් වීම සහ "පෙර පරිදිම වැඩ" කරගෙන යාම මගින් සමාජය තුළ රජය කෙරෙහි වන කළකිරීම සහ අවඥාසහගත බව වැඩි වීමට මෙන්ම ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට එරෙහි වූවන් ශක්තිමත් කිරීමට ද හේතු කාරක වනු ඇත. යහපාලනයට සහ දූෂණය කිසිසේත්ම නොඉවසීමට රජය පෙර ප්‍රකාශ කළ කැප වීම ක්‍රියාව තුළින් ප්‍රදර්ශණය නොවේ නම් එමගින් 2015 ජනවාරි සහ අගෝස්තු ප්‍රජාතන්ත්‍රික ජයග්‍රහණයන් තීරණාත්මක ලෙස අනතුරට ලක් වීමට සහ පොදුවේ ගත් කළ ප්‍රතිසංස්කරණයන් පිළීපැනීමට හේතුවනු ඇති බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මින් පෙරද රජයට අනතුරු හඟවා ඇත.

දැන් පෙනී යන ආකාරයට තවමත් ඒ පිළිබඳව රජය සැළකිල්ලට ගෙන නැත.